**පූජ්‍ය ගලිගමුවේ ඤාණදීප ස්වාමීන් වහන්සේගේ අනුශාසනා පරිදි හොරණ දික්හේන්පුර ඉදිකර ඇති ශීල සුව අරණ ගිලන් භික්ෂු ප්‍රතිකාර මධ්‍යස්ථානයේ වැඩ සිටින භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය කරන වෛද්‍ය පහසුකම්, බෙහෙත් ද්‍රව්‍ය, ශල්‍යකර්ම, රෝහල් ගතකිරීම්, සාත්තු සේවක වියදම් ආදිය සඳහා ආධාර පිණිස ආහාර පොළක් 2016 අප්‍රේල් 03 වැනි ඉරිදා පෙ.ව. 11.00 සිට ප.ව. 5.00 දක්වා** ARTHUR WREN HALL Stuart Ave, Hampton Park (Mel Ref. 96 E8) **දී පැවැත්වේ.**

BUFFET LUNCH
(Biriyani, Kotthu, Dosai)

Tickets – Family -$ 60
Single - $ 20

විමසීම් - ජයනෙත්ති - 0417135248
සුපින් - 0414800283
වසන්ත - 0426969189

## වෛශාඛ්‍ය සද්ධර්ම යාත්‍රා



රුවන් ගෙයි වැඩ සිටි උතුම් සම්බුදු සමිඳු
මෙනෙහි කළෙ පට්ඨාන දම් සතරවන සතිය තුළ
ෂඩ් වර්ණ බුදු රැසින් බැබලුනා බුදු සිරුර...
දෙසූ අභිදම් නදින් තිදස පුර ගිගුම් දී
අසිරිමත් බුදු නුවණ තුන් ලොවම පතල වී...

ඒ මහා සම්බුදු නුවණට උපහාර පිණිස පවත්වන
**"මහා පට්ඨාන පූජාව"**
බෙරික් ශාක්‍යමුනි සම්බුද්ධ විහාරයේදී
අප්‍රේල් 02 වන ශනි දින
සවස 07.00 ට...

Sakyamuni Sambuddha Vihara
125 Homestead Road, Berwick, Vic 3806, Australia
Tel : 03 9702 6275, Web : www.vihara.org.au , Facebook : www.facebook.com/berwicktemple

**ශ්‍රී ලාංකීය ඔබහට**
**නිවසේදීම සැකසූ ප්‍රණීත ආහාර**
**ඉතා පහසු මිලකට**
**පිළියෙල කර දෙනු ලැබේ**

**ඇනවුම් සඳහා අමතන්න**
**0416 966 621**




අජිත් පැරකුම් ජයසිංහ

අසූ නමයේ කැරැල්ල ජාතිවාදය සමග මුසු වූ එකක් විය. ජාතිකවාදයෙන් අවදි කරන ලද මිනිසුන් සමාජවාදී අරගලය වෙත යොමු කළ හැකි වනු ඇතැයි ඒ කැරැලිකරුවෝ අපේක්ෂා කළෝ ය. එය වැරදි ය. ඒ වරද වෙනුවෙන් එක් තරුණ පරම්පරාවක් ම වන්දි ගෙව්වේ ය. එහෙත්, ඒ මිනිසුන් තුළ තිබුණේ සමාජ යහපත උදා කිරීමේ චේතනාවකි.

එය අතිශය කුරිරු මර්දනයක් විය. තරුණ ජනයා අමු අමුවේ මරා දමන ලදී. වධ දී මරා දමන ලද ජවිපෙ තරුණයන්ගේ මළ සිරුරු වීදි අයිනේ බාගෙට පුළුස්සා බලු කපුටන්ට කන්නට දුන්නේ ය. තරුණ සිරුරුවලින් පහුරු බැඳ ගංගා දිගේ පා කර හරින ලදී. දස දහස් ගණන් තරුණයන් වධකාගාරවල දස වධයට පාත්‍ර කරන ලදී.

ඇල්ලේ ගුණවංශ යනු මේ කැරැල්ල ලෙයින් යකඩින් මර්දනය කරන්නට හමුදාවට හා රජයට ආවැඩූ ප්‍රේමදාස හිතවාදී මහණෙකි. මිනීමරු කැරැලි මර්දන ව්‍යාපෘතියක සංස්කෘතික හා ආගමික පාර්ශ්වකරුවෙකි.

අසූ නමයේ කැරැල්ලෙන් පසු ඔහු ගීත එකතුවක් දොරට වැඩුවේ ය. ඒ වනාහි අසූ නමයේ කැරැල්ලේ ජනප්‍රිය වූ නන්දා මාලිනීගේ පවන ප්‍රසංගය හා ගීතාවලිය විසින් මතු කරන සංකල්පනා යටපත් කිරීමේ හා ජවිපෙ මර්දනය කිරීම නිසා පිරිහී තිබුණු මහජන සහයෝගය නැවත ලබා ගැනීමේ මිලිටරි උවමනාවකින් නිර්මානය කරන ලද යුද සංගීතයකි.

"එකම රෑනෙ කුරුල්ලෝ" ගීය ගැයුවේ එවකට යුද හමුදා සංගීත කණ්ඩායමේ සිටි විජේසුන්දර වේරගොඩ විසිනි.

එය නිර්මාණයක් ලෙස වෙන ම සලකා බලන්නට පුළුවන. එහෙත්, එහි පසුබිම වනාහි තරුණ තරුණියන් දස දහස් ගණනකගේ රුධිරයෙන් ලියවුණු එකකි. ඒ ක්ෂතිමය අත්දැකීමට මුහුණ දුන් අයෙකුට එය ඒ සංදර්භයෙන් ගලවා රස විඳින්නට බැරි ය. ඒ වනාහි මරා දමන ලද දස දහස් ගණනක් සහෝදර සහෝදරියන්ගේ හා ඔවුන්ගේ ප්‍රියයන්ගේ දුක් ගී හඬ යටපත් කරවන්නට ගැයූ ගීයකි.

අසූ නමයේ කැරැල්ලෙන් පසු අවුරුද්දයි මාසයයි දවසක් යදමින් බැඳ විලංගු ලා එළියකන්දේ වධකාගාරයේ වධයට බඳුන් වූ 25 හැවිරිදි තරුණයෙක් 1990දී මේ ගීය මුල් වරට ඇසුවේ වීරවිල රැඳවුම් කඳවුරේ තුනේ වාට්ටුවේ බිත්තියේ සවි කළ රෙඩිෆියුෂන් ගුවන් විදුලි කට්ටලයෙනි. ඔහු හා ජවිපෙ සමග එක්ව අරගල කළ බොහෝ දෙනෙක් ඒ හඬ අසන්නට ඉතිරිව නො සිටියෝ ය.

පිළිම නෙළා නැති විරුවන් පිරිසක්
සැමරුම් දින නැති විරුවන් පිරිසක්
සැතපෙන බව පස් කඳු යට රහසේ
මිහිකත කම්පා වී
ගුගුරා දෙස් දේවී

ඔබ ඉපදෙන්නට පෙර සිදු වූ කිසිවක් නො දැන සිටීම යනු හැමදාමත් ළමයකු ලෙස සිටින්නට සිදු වීම යයි ක්‍රිස්තු පූර්ව පළමු සියවසේ විසූ රෝම දාර්ශනිකයකු වන සිසරෝ පවසා තිබේ.

වසර 27කට පසු තවත් පරම්පරාවක ජවිපෙ සමාජවාදී තරුණ ගැහැනු හා පිරිමි රොත්තක් ඇල්ලේ ගුණවංශගේ මිලිටරි සිංදුව වඩාත් කැතට කියමින් චොකා බයිලා නර්තනයක යෙදී එයිනුත් පසුව වියරු නාසිවාදීන් පිරිසක් සේ එස්වයියූ කියා කෑ ගසන හැටි අසා මම කම්පනයට පත් වුණෙමි.

අසූ නමයේ කැරැල්ලේදී වාද්දුව හමුදා කඳවුරට පහර දීමට තැත් කිරීමේ චෝදනාව මත සිර බත් කෑ ටිල්වින් සිල්වා මේ ගීයේ තාලයට අත්පුඩි ගසනු දැක මට මහා පිළිකුලක් ඇති විය. මින් එහාට මම කිසිවක් නො කියමි.

එළිකන්ද වධකාගාරයට ගෙනැවිත් පහර දී වධයට බඳුන් කර සිටි මොහොමඩ් නම් කින්නියාවේ තරුණයාට 'තම්බියා තෝ කියපිය හින්දි සිංදුවක්ඩ' යි වධකයෝ කී හ. ඔහු දෙනෙතින් කඳුළු රූරා හැලෙමින්, එහෙත් මියුරු ලෙස අංජානා ගීය ගැයූ හැටි මගේ දෑස් ඉදිරිපිට මැවී පෙනේ.

සිරිපා අඩවියේ ජවිපෙ යුද පුහුණු කඳවුරකට සහභාගි වූවකු නිසා වසරක් පමණ කාලයක් තිස්සේ අනන්ත වධයට පාත්‍ර කර පසුව මරා දමන ලද මාතර සුමිත් මල්ලිට 'තෝ සිංහල සිංදුවක් කියපියඩ' යි කී විට ඔහු අම්මා ජීවන උයන් තෙරේඩ ගීය ගැයූ හැටි මට එම ගීය අසන විට තවමත් මතක් වේ.

**සහෝදරයිනි, මිය ගිය ඔබ පිවිතුරු ය. අපි පව්කාරයෝ වෙමු. සමාවෙන්න.**